**ශීර්ෂ - 176 - සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1.1 විගණන විෂය පථය

සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරිට 2015 ඔක්තෝබර් 30 දින නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරික්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරිම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරික්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙනයාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 26,791.4ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානවන විට ඉන් රු.මිලියන 26,613.9 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම රු.මිලියන 177.5 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.66 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 168.9 | 160.3 | 8.6 | 5.09 |
| මූලධන | 26,622.5 | 26,453.6 | 168.9 | 0.63 |
| **එකතුව** | **26,791.4** | **26,613.9** | **177.5** | **0.66** |

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

2014 වර්ෂය සඳහා ආදායම් සංකේතයකින් රු.මිලියන 5,700 ක ආදායම් රැස්කිරීමට අමාත්‍යාංශය විසින් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී ඉන් රු.මිලියන 3,605 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය විසින් ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 63 ක ආදායමක් රැස්කර තිබුණි.

## 2.3 අත්තිකාරම් ගිණුම

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 17601 | 2.5 | 2.2 | 1.6 | 1.7 | 10.0 | 8.2 |

2.4 **අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.28,840 ක් විය.

2.5 **විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂ 176 - සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | | **අදාල රෙගුලාසි** |
|---|---|---|
| (i) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. |

3.2 **විසර්ජන ගිණුම**

**-------------------**

**අයවැය විචලනය**

**----------------------**

වැය විෂයයන් 10 ක් සඳහා එකතුව රු.174,725,323 අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරිමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 76 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

3.3 **ආදායම් ගිණුම**

**-----------------**

ආදායම් සංකේතය 20.03.02.08 දරන ආදායම් ගිණුමට අදාළව 2002 ජුලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 03 ඡේදය හා මුදල් රෙගුලාසි 142 ප්‍රකාරව ආදායම් පුරෝකථනය හා ඇස්තමේන්තු කිරිම නිවැරදි පදනමකින් සිදු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මුල් ආදායම් ඇස්තමේන්තුව අනුව රු.මිලියන 3,000 ක ආදායම් රැස්කිරිමට අපේක්ෂා කර තිබුණත්, පසුව එම ඇස්තමේන්තුව රු.මිලියන 5,700 ක් ලෙස සංශෝධනය කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 3,605 ක ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව තථ්‍ය ආදායම මුල් ඇස්තමේන්තුව ඉක්මවා තිබුණත් සංශෝධිත ඇස්තමේන්තුවට ළගා වී නොතිබුණි. ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරිම සඳහා ආදායම් පුරෝකථනය නිවැරදිව සිදු කර නොතිබුණු බව නිරික්ෂණය විය.

3.4 **රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**-------------------------------------------------------------------**

විෂය අංක 17601 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2014 දෙසැම්බර් 31 දිනට වු සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිගහිට තිබුණු ශේෂවල එකතුව රු.783,675 ක් වු අතර, එම හිගහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 18 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, ඒවා අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් ඉඩමේ ඇටෝර්නි බලයට අදාල නිත්‍යානුකුල තත්ත්වය සොයා බැලීමකින් තොරව නිලධාරියෙකු වෙත රු.224,600 ක දේපල ණය මුදලක් ප්‍රදානය කර තිබුණි.

(ඇ) 1999 ජනවාරි 23 දින සේවය හැර ගිය නිලධාරියෙකු ගෙන් අය විය යුතුව තිබුණු රු.224,600 ක දේපල ණය මුදල වර්ෂ 7කට අධික කාලයක් මුළුල්ලේ පැවැත එමින්

තිබුණත්, එම ණය ශේෂය අයකර ගැනිමට අමාත්‍යාංශය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.5 **අනුකුල නොවීම්**

**නීති, රිතී හා රෙගුලාසිවලට අනුකුල නොවීම**

නියැදි විගණන පරික්ෂණවලදී නිරික්ෂණය වූ නීති, රිතී හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකුල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීතී හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකුල නොවීම් |
|---|---|---|
| | රු. | |
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 2009 ඔක්තෝබර් 21 දිනැති අංක 13/2008(III) දරන චක්‍රලේඛයේ 02 ජේදය | 68,040 | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව මාස තුනකට ආසන්න කාලයක් සේවයට වාර්තා නොකර 2014 වර්ෂයේ දී නිවාඩු ලබාගෙන සිටි නිලධාරිනියකට චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ඉන්ධන දීමනාව ගෙවා තිබුණි. |
| **(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන චක්‍රලේඛයේ 2 ජේදය හා 2011 නොවැම්බර් 15 දිනැති අංක PFD/RED/01/04/08 දරන චක්‍රලේඛ ලිපියෙහි 1 හා 2 ජේද | 160,296 | කළමනාකරණ සහකාර සේවයේ 1 වන පන්තියේ නිලධාරිනියකට චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව හා විධිමත් අනුමැතියකින් තොරව නිවාස හා ජංගම දුරකථන ගාස්තු 2011 වර්ෂයේ සිට 2015 ජනවාරි මාසය දක්වා ගෙවා තිබුණි. |

3.6 **කාර්යසාධනය**

**-----------------**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරික්ෂණ පහත දැක්වේ.

(අ) 2014 වර්ෂය සඳහා අමාත්‍යාංශය පිළියෙල කළ ක්‍රියාකාරි සැලැස්ම අනුව වර්ෂය අවසානයේදී ඉටු කළ කාර්යයන් හි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳ වාර්තා අමාත්‍යාංශය විසින් පිළියෙල කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා එයාර් ලයින් හා මිහින් ලංකා සමාගම්වල ප්‍රාග්ධනයට රු.මිලියන 26,113 ක ආයෝජනයන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ආයෝජනයන් උපයෝජනය කළ ආකාරය පිළිබඳ සොයා බලා නොතිබුණි. මේ නිසා එම ආයෝජනයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අධික්ෂණය ඉතා දුර්වල මට්ටමක පැවැතුණි.

**3.7** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-----------------------------------**

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ එවැනි ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

අමාත්‍යාංශයේ හිටපු ගරු අමාත්‍යතුමා හා හිටපු නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේ පවත්වනු ලැබූ සංග්‍රහ කටයුතු වෙනුවෙන් රු.157,480 ක වියදම් සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ වැය විෂය යටතේ වැය කර තිබුණි.

3.8 **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

-------------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 10 | 09 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 02 | -- |
| (iii) | ද්විතීයික මට්ටම | 42 | 33 | 09 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 22 | 20 | 02 |
| (v) | වෙනත් | 02 | 01 | 01 |
| | එකතුව | 78 | 65 | 13 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 13 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ) **වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් රජයේ සමාගමකට අයත් කාර්ය මණ්ඩලයේ 7 දෙනෙකු අමාත්‍යාංශයේ කාර්යයන් සඳහා යොදාගෙන තිබුණි.